රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. RG/MBD/1/චක්‍රලේඛ

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE

තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

ඔබේ අංකය / உமது இல. / Your No.

234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත, බත්තරමුල්ල.
234/A3, டென்சில் கொப்பேகடுவ மாவத்தை, பத்தரமுல்லை.
234/A3, Denzil Kobbakaduwa Mawatha, Battaramulla.

දිනය / திகதி / Date 2021.03 25

චක්‍රලේඛ අංක 08/2021

සියළුම ප්‍රාදේශිය ලේකම්/ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන්,

ඉඩම් රෙජිස්ට්‍රාර් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් වෙත.

**උප්පැන්න විවාහ, හා මරණ සහතික පිටපත් නිකුත් කිරීමේ ගාස්තු හා ප්‍රකාශපත්‍ර සඳහා වන ගාස්තු සංශෝධනය කිරීම**

2019 වර්ෂයට අදාල අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් 2021.03.01 වන දිනැතිව අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති බැවින්, 2021.04.01 වන දින සිට පහත කරුණු සම්බන්ධයෙන් සංශෝධිත ගාස්තු අය කිරීමට කටයුතු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

| | කාරණය | සංශෝධිත ගාස්තුව |
|---|---|---|
| 1 | සහතික කළ පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේදී ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය නොවන අවස්ථාවක, සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා | රු. 120.00 |
| 2 | සහතික කළ පිටපතක් සඳහා ඉල්ලුම් කිරීමේදී අවු 02කට නොවැඩි කාලයක් සඳහා ලේඛන සෝදිසි කිරීමක් අවශ්‍ය වන අවස්ථාවක, සහතික කළ පිටපතක් හෝ උධෘතයක් හෝ ලියාපදිංචි නොකිරීමේ සහතිකයක් හෝ නිකුත් කිරීම සඳහා | රු. 250.00 |
| 3 | උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 27, 27(අ) , 52 වගන්ති යටතේ ඉදිරිපත් කරනු ලබන ප්‍රකාශ පත්‍රවලට එක් ප්‍රකාශ පත්‍රයක් සඳහා | රු. 60.00 |
| 4 | ඉපදී මාස 3 ක් ඉක්මවූ කල්ගත උපතක් ලියාපදිංචි කිරීම සඳහා වන 24 වගන්තිය යටතේ වන එක් ප්‍රකාශ පත්‍රයක් සඳහා | රු. 60.00 |
| 5 | මියගොස් මාස 3 ක් ඉක්මවූ කල්ගත මරණයක් ලියාපදිංචි කිරීම සඳහා වන 36 වගන්තිය යටතේ වන එක් ප්‍රකාශ පත්‍රයක් සඳහා | රු. 60.00 |

අ.පි.බ



දුරකථන අංකය / தொலைபேசி இல. / Telephone No. 2889488, 2889489
ෆැක්ස් අංකය / தொலைநகல் / Fax No. 2889491
වෙබ් අඩවිය / இணையத்தளம் / Website www.rgd.gov.lk
විද්‍යුත් තැපෑල / மின்னஞ்சல் / Email rgd@sltnet.lk, rg@rgd.gov.lk

02. නවද ඉහත ගාස්තු සංශෝධනය පිළිබඳව ඔබ බල ප්‍රදේශයේ සියලුම විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසත් මහජනයාගේ දැනගැනීම සඳහා මෙම සංශෝධිත ගාස්තු පිළිබඳ දැන්වීමක් ඔබේ කාර්යාලයේ ප්‍රදර්ශනය කිරීමට කටයුතු කරන ලෙසත් වැඩිදුරටත් දන්වා සිටිමි.

ඩබ්.එම්.එම්.බී. වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්

ඩබ්.එම්.එම්.බී.වීරසේකර
රෙජිස්ට්‍රාර් ජනරාල්
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
නො.234/ඒ 3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
කොස්වත්ත, බත්තරමුල්ල.

පිටපත්.

1. ලේකම්, රාජ්‍ය ආරක්ෂක හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය - කරුණාකර දැන ගැනීම සඳහා
2. අධ්‍යක්ෂ ජනරාල්,රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව - කරුණාකර දැන ගැනීම සඳහා
3. විගණකාධිපති - කරුණාකර දැන ගැනීම සඳහා
4. සියලුම දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර්වරුන් - කරුණාකර දැන ගැනීම සඳහා
5. ප්‍රධාන ගණකාධිකාරී - අවශ්‍ය කටයුතු සඳහා
6. ප්‍රධාන කාර්යාලයේ සියළුම මාණ්ඩලික නිලධාරීන් - කරුණාකර දැන ගැනීම සඳහා
7. සියලුම කලාප භාර හා කළාපභාර නියොජ්‍ය/ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරු - කරුණාකර දැන ගැනීම සඳහා
8. සියලුම දිස්ත්‍රික් භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - කරුණාකර දැන ගැනීම සඳහා
9. සහකාර අධ්‍යක්ෂ, තොරතුරු තාක්ෂණ - කරු. වෙබ් අඩවිය යාවත්කාලීන කිරීම සඳහා